# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/HRD /120/GB.Cir/2019
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.04.08

**අයවැය චක්‍රලේඛ අංක: 2/2019**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් අයවැයකරණයට අදාළ දත්ත හා තොරතුරු රැස්කිරීම හා සෑම අමාත්‍යාංශයකම ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ කේන්ද්‍රීය ඒකක පිහිටුවීම**

ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ සමාජ, ආර්ථික, අධ්‍යාපන තත්ත්වයන් අනෙකුත් රටවල කාන්තාවන්ට වඩා ඉහළ මට්ටමක පවතින අතර, විවිධ සෞඛ්‍ය, සමාජ දර්ශක අතින් ලොව දියුණු රටවල පවත්නා සමාජ ආර්ථික දර්ශකයන් හා සමාන මට්ටමක් අත්පත් කරගෙන ඇත. නිදහසින් පසු අප රට තුළ ක්‍රියාත්මක කළ නිදහස් අධ්‍යාපන, සෞඛ්‍ය ප්‍රතිපත්තීන් හා ඊට සම්බන්ධිත වැඩසටහන් තුළින් මෙම ප්‍රගතිය අත්පත් කරගෙන ඇත.

02. ශ්‍රී ලංකාවද එකඟ වී ඇති එක්සත් ජාතීන්ගේ 2030 තිරසර සංවර්ධන අරමුණු අංක 05 ට අනුව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සියලුම කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම පිළිබඳ සඳහන් වේ. මෙහි ආරම්භයක් ලෙස තිරසර සංවර්ධන අරමුණු දේශීයකරණය කරමින් එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සෘජුවම උපකාරී වන ප්‍රධාන කාර්යසාධන දර්ශක 12 ක් 2018 වසරේ අයවැය කැඳවීම් අවස්ථාවේ දී හඳුන්වා දෙන ලදී. ඔබ අමාත්‍යාංශයට අදාල වන පරිදි එම කාර්යසාධන දර්ශක 12හි ප්‍රගතිය 2019.06.30 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවන ලෙස කාරුණිකව දන්වමි.

03. තිරසර සංවර්ධන අරමුණු හා අවාසිදායක තත්වයේ සිටින කාන්තාවන් පිළිබඳ අවධානය යොමුකරමින් ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2019 වසරේ අයවැය කථාවේදී කාන්තාවන් ආර්ථික හා සමාජීය ලෙස සවිබල ගැන්වීමට අදාළ මූලික යෝජනා කීපයක් ඉදිරිපත් කර ඇත. ඒ යටතේ 2019 වසරට අදාළ අයවැය කථාවේ යෝජනා අංක 160 මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල අයවැයකරණය හා ප්‍රතිපත්ති සම්පාදනයේදී හා ක්‍රියාත්මක කිරීමේදී එයට අදාළ දත්ත හා තොරතුරු ලබාගැනීමට පහසුකම් සැලසෙන පරිදි සෑම අමාත්‍යාංශයක් යටතේම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත

පදනම් වූ කේන්ද්‍රීය ඒකකයක් පිහිටුවීමට යෝජනා කර ඇත. ඒ අනුව මෙම කේන්ද්‍රීය ඒකක (Gender Focal Point) කාන්තා හා ළමා කටයුතු හා වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කර ගනිමින් පිහිටුවිය යුතුය. එසේම, එම ඒකක ඔබ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාළ වන පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල වන පරිදි දත්ත හා තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යායුතුය. උදාහරණයක් ලෙස එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති, සෞඛ්‍ය,අධ්‍යාපන, සුභසාධන වැඩසටහන්, ප්‍රතිලාභී ලේඛන පිළිබඳව ස්ත්‍රී පුරුෂ ලෙස දත්ත වෙන් කොට තබා ගැනීම සිදු කළයුතු අතර, එම තොරතුරු සැම වසරකම ජූලි මස 31 දිනට පෙර කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයට යැවීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

04. ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ සමාජ ආර්ථික අවස්ථාවන් වර්ධනය වන අයුරින් සියළුම අමාත්‍යාංශයන් තම විෂයය පථයට අදාළව සිදුකරන ව්‍යාපෘති සහ වැඩසටහන් සකස් කළයුතු අතර, කාන්තාවන්ගේ සමාජ ආර්ථික ගැටළු අවම කර ගැනීමට එම වැඩසටහන් ඉවහල් විය යුතුය.

**ඒ.ආර්.දේශප්‍රිය**
**භාණ්ඩාගාර ලේකම් (වැ.බ.)**

පිටපත්:-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති